# අංගරචනයක් සිදු කරන ආකාරය

- අංගරචනයේ දී විවිධ ආලේපන ඉතා ප්‍රවේශමෙන් ගැල්විය යුතු වන්නේ සජීව ව නළුවාගේ සම මත ඒවා ආලේප කරන බැවිනි. සමට හානිකර ද්‍රව්‍ය භාවිතය මඟින් විවිධ ගැටලු ඇති විය හැකි බැවින් වෙළඳ පොළෙහි ඇති අනුමත ද්‍රව්‍ය හා උපකරණ පමණක් අංගරචනා සඳහා යොදා ගත යුතුය.

  උදාහරණ-

  මුහුණෙහි පදනම් ආලේපය සඳහා යොදන ද්‍රව්‍ය

  රැවුල හා වෙනත් දේ ඇලවීම සඳහා ස්පිරිට් ගම් භාවිතය

  වර්ණ ගැන්වීම සඳහා lining colours වර්ග භාවිතය

  (අංගරචනා උපකරණ පිළිබඳ 10 ශ්‍රේණියේ අංගරචනය පාඩමෙන් විස්තරාත්මකව අධ්‍යයනය කළ හැක)

- අංගරචනය නියම ආකාරයෙන් සිදු කිරීමට හොඳින් ආලෝකය ඇති ස්ථානයක් තෝරා ගත යුතුය.

- අංග රචනා ද්‍රව්‍ය හා උපකරණ පිළිවෙලකට තබා ගත යුතුය.
- චරිත සඳහා පෙනී සිටින්නන් ද තම මුහුණ හොඳින් පිරිසිදු කොට ගෙන අංගරචනය කිරීම සඳහා පැමිණිය යුතුය.
- අංගරචනා ශිල්පියා ද තම දෑත් පිරිසිදුව තබා ගත යුතුය.
- අංගරචනා කිරීමේ දී නළුනිළියන් ගේ මුහුණේ සියුම් උපාංගයන්ට හානියක් නොවන පරිදි මනා අවබෝධයකින් යුතුව හා ඉවසිලිවන්තව සිදු කළ යුතුය.
- එක් එක් නළුවා ගේ සමේ වර්ණයට ගැළපෙන පදනම් ආලේපය තෝරා මුහුණේ ආලේප කළ යුතුය. මේ සඳහා මෙම පදනම් ආලේපන අංකනය කර ඇති අතර නළුවා ගේ හෝ නිළිය ගේ සමේ වර්ණය අනුව ආලේප කළ යුතු වර්ණයට අදාල අංකය සහිතව ඒවා තෝරා ගත යුතුය.
- පවුඩර් වර්ග ආලේප කිරීමේ දී ස්වභාවික ලෝම සහිත බුරුසුවක් යොදා ගැනීමත්, ක්‍රීම් වර්ග ආලේපයේ දී කෘත්‍රිම කෙඳි සහිත බුරුසුවක් යොදා ගැනීමත් වඩාත් යෝග්‍ය වේ. එමෙන් ම එක් එක් වර්ණයන්ට වෙන වෙන ම බුරුසු භාවිතා කල යුතුය.
- නළලේ සිට නිකට දක්වා අවශ්‍ය ලෙස අංගරචනය කළ යුතුය. එහි දී, eyebrow pencils, eye shadows, mascara, eye liners, lipsticks, lip liners, lining colours යොදා ගත හැක.
- මුහුණේ හෝ ශරීරයේ ඇතැම් තැන්වල විවිධ හැඩ සැකසීමට අවශ්‍ය නම් ඒ සඳහා " නෝස් පොටී " යොදා ගත හැක.

උදාහරණ ලෙස - නාසය දිගුකොට පෙන්වීමට
නිකටෙ හි හැඩය වෙනස් කිරීමට
තොල් විශාල කිරීමට හෝ වෙනත් විකෘතිතා දැක්වීමට



- දත් නොමැති බව හෝ දත් දිරා ගිය බව දැක්වීමට අවශ්‍ය නම් "ටූත් එනැමල්" භාවිතා කළ හැක.
- රැවුල් ආදිය සකස් කිරීම සඳහා "ක්‍රේප් හෙයා" යොදා ගැනීම ද ඇලවීම සඳහා "ස්පිරිට් ගම්" යොදා ගැනීම ද කළ හැක.

- අවශ්‍ය නම් කොණ්ඩය සඳහා "විග් " වර්ග භාවිත කළ හැක.
- අංගරචනා ද්‍රව්‍ය මුහුණෙන් ඉවත් කිරීම සඳහා " බේබි ඔයිල් " භාවිත කළ යුතුය. අංගරචනයක් යෙදීමෙන් පසු ඉතා ඉකමනින් හා නිවැරදි ක්‍රමයට ඒවා ඉවත් කිරීම සිදු කළ යුතුය.

ඇගයීම :

1. සිංහබාහු නාට්‍යයේ සිංහයා ගේ චරිතය ඔබට අංගරචනා කිරීමට ලැබුණහොත් ඔබ එය සිදු කරන ආකාරය උපකරණ පිළිබඳව ද සඳහන් කරමින් පියවර වශයෙන් ලියන්න.
2. අංගරචනය නාට්‍ය නිර්මාණයක දී වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.